# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No – 10120

ෆැක්ස් / தொலைநகல / Fax – 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone – 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site – www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail – dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO – 709 /2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No – / 2024

දිනය / திகதி / Date – 25/04/2024 පැය 1530

## මාධ්‍ය නිවේදනය

### පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු

**01. 2024.04.24 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරින් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 04 | 04 | 777 | - | ප්ලාස්ටික් බැරල් 01<br>යකඩ බැරල් 04 |

වැටලීම් සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් හා දේපල අදාළ පොලිස් ස්ථාන වෙත ඉදිරිපත් කර ඇත.

**02. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා බුද්ධි කොට්ඨාසය.**

2024.04.24 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා බුද්ධි කොට්ඨාසයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත ගුන්ඩ්පාස් පොලිස් වසමේ මාදම්පිටිය ප්‍රදේශයේ දී වැටලීමක් සිදු කර **හෙරොයින් කිලෝ 01 ග්‍රෑම් 10 ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශය වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 31 ක් වූ කොළඹ 15 ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ. පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශ** වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**03. හෙරොයින් ජාවාරමෙන් උපයා ගන්නා ලද මුදල් යැයි සැකසහිත මුදල් තොගයක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා බුද්ධි කොට්ඨාසය.**

2024.04.24 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා බුද්ධි කොට්ඨාසයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වෙල්ලවිදිය පොලිස් වසමේ මධ්‍යම පාර ප්‍රදේශයේ දී වැටලීමක් සිදු කර **මත්ද්‍රව්‍ය ජාවාරමෙන් උපයා ගන්නා ලද බවට සැකකරන මුදල් රුපියල් 4,986,000/- ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශය වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 34 ක් වූ කොළඹ 12 ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වන අතර මොහු සංවිධානාත්මක අපරාධකරුවෙකුගේ සමීපතමයෙකු බවට අනාවරණය වී ඇති අතර පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශය** වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**04. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා බුද්ධි කොට්ඨාසය.**

2024.04.24 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා බුද්ධි කොට්ඨාසයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත ග්‍රෑන්ඩ්පාස් පොලිස් වසමේ මාදම්පිටිය ප්‍රදේශයේ දී වැටලීමක් සිදු කර **හෙරොයින් ග්‍රෑම් 50 මිලි ග්‍රෑම් 150 ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශය වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 31 ක් වූ කොළඹ 15 ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ. පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශය** වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**05. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා සංවිධානාත්මක අපරාධ මර්ධන ඒකකය.**

2024.04.24 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා සංවිධානාත්මක අපරාධ මර්ධන ඒකකයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත මීටියාගොඩ පොලිස් වසමේ මීටියාගොඩ ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 06 ක්** සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන මීටියාගොඩ පොලිස් ස්ථානයට භාරදී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු **වයස අවුරුදු 36 ක් වූ මීටියාගොඩ ප්‍රදේශයේ** පදිංචිකරුවෙකු වේ. මීටියාගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**06. අයිස් හා හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකාය.**

2024.04.24 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරීන්ට ලද තොරතුරක් මත වැල්ලම්පිටිය පොලිස් වසමේ කොටුවිල ප්‍රදේශයේ දී වැටලීමක් සිදු කර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 11 මිලි ග්‍රෑම් 740 ක් හා හෙරොයින් ග්‍රෑම් 11 මිලි ග්‍රෑම් 700 ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන වැල්ලම්පිටිය පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 41 ක් වූ වැල්ලම්පිටිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ. වැල්ලම්පිටිය පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**07. බලපත්‍ර නොමැතිව විවිධ ප්‍රමාණයේ ලී කඳන් තොගයක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා යාපනය කඳවුර.**

2024.04.24 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා යාපනය කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත මාංකිප්පායි පොලිස් වසමේ නවාලි ප්‍රදේශයේ දී වැටලීමක් සිදු කර **බලපත්‍ර නොමැතිව විවිධ ප්‍රමාණයේ ඉරන ලද බුරුත කඳන් 30 ක් හා පළු ලී කඳන් 33 ක් සමඟ සැකකරුවන් දෙදෙනෙකු** අත්අඩංගුවට ගෙන යාපනය වන සංරක්ෂණ දෙපාර්තමේන්තු කාර්යාලය වෙත භාර දී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරුවන් වයස අවුරුදු 33 ක් හා 43 ක් වූ නවාලි අතුර හා පුංකුඩිතිව් ප්‍රදේශ වල පදිංචිකරුවන් වේ.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**